# අපිම අපේ ප්‍රශ්න විසඳගන්න ඕන නිසා නාට්‍ය සමාගමක් පිහිටුවා ගත්තා

"ශ්‍රී ලංකාවේ වේදිකා නාට්‍ය කලාව ප්‍රපාතයකට ඇද වැටෙමින් පවතින බව බොහෝ දෙනා පැවසුවත් ඒ සඳහා කිසිවෙකු මෙතෙක් පිළියම් යෙදුවේ නම් නැහැ. මේ නිසා බොහෝ දෙනා රජයට ඒ වගේම නාට්‍යකරුවන්ට, නාට්‍ය අනු මණ්ඩලයට, ප්‍රේක්ෂකයන්ට දෙස් පවරනවා. ඒ වුණත් හැමෝම දෙස් පැවරුවා



සරත් කොතලාවල

මිසක් කරපු කිසිම දෙයක් නැහැ. මේ රට ගැරිම පුදුම රටක්. කරුමක්කාර මිනිසුන් ඉන්න හොඳ රටක්. ඒ නිසා කිසිම දේකට මේ රටේ පිළියමක් යෙදුණේ නැහැ. අපට ඇහිලා තියෙනවා සමහර ප්‍රවීණයෝ එකතු වෙලා මේ නාට්‍ය කලාව රැක ගන්න නම් කළ යුතු දේ පිළිබඳව විවිධ අදහස් දරනවා. ඒ අතරේ තිබුණා අපේ රටේ නාට්‍ය සමාගම් කියන දේ ඇති වුණොත් තරමක් දුරට හෝ මේ නාට්‍ය කලාව දියුණු කරන්න පුළුවන් කියලා. මේ නිසා කාටවත් බැනලා වැඩක් නැහැ. අපි අපේ ප්‍රශ්න විසඳගන්න ඕන. ඒ නිසා තමයි අපි තීරණය කළේ නාට්‍ය සමාගමක් ගොඩ නගා ගන්න."

මෙහෙම කියන්නේ අපේ රටේ ඉන්න ප්‍රවීණ යැයි හඳුන්වන වේදිකා නාට්‍ය ශිල්පීන් පිරිසක් නෙමෙයි. වේදිකාවට ඇති ආදරය නිසාම වේදිකාවේ දිගු ගමනක් යන්නට පෙරුම් පුරන වේදිකා නාට්‍ය ශිල්පීන් දෙළොස් දෙනෙක්. ඒ වුණත් ඔවුන්ගේ මේ කර්තව්‍යය ගැන කතා කරන්න එන් වුණේ නම් ඒ කණ්ඩායමේ සාමාජිකයෝ දෙන්නෙක් වන සරත් කොතලාවල හා ධර්මප්‍රිය ඩයස්.

"අපේ කණ්ඩායම අවසානයේ සමාගමක් වේවි. තවමත් මේක පුංචි කණ්ඩායමක්. මේකේ නම Step Set Theatre Gang අපේ කණ්ඩායමේ සාමාජිකයෝ දෙළොස් දෙනෙක් ඉන්නවා. ඒ සුමේද ගෝවිතාරණ, සංජීව උපේන්ද්‍ර, රංග සමරකෝන්, රවිනි අනුරාධා, කළණ ගුණසේකර, රුවන් මලිත්, සමන්ති කොතලාවල, සුනිල් පතිරණ, ආනන්ද ප්‍රේමලාල් හා අපි දෙන්නා. අපි කණ්ඩායමක් ලෙස එක්වෙන්නට පළමු කාරණය වුණේ පසුගිය දශකයේ නාට්‍ය පවත්වාගෙන යන කාරණය, සහ ඒ තුළින් රට එකතු වන විවිධ ශිල්පීන් අසරණ වීම වගේ දේවල් අප දුටුවා. මේ හැම දෙයකම සාර්ථකත්වයට ආර්ථිකයත් බලපානවා. ඒ නිසා වේදිකාවේ රැඳිය යුතු ශිල්පීන් වේදිකාව අතහැර යනවා. වේදිකා නාට්‍ය ශිල්පීන්ට පිළිගැනීමක් නැහැ. පැවැත්මක් නැහැ. මේ නිසා වේදිකා නාට්‍ය කලාවත් පසුබෑමකට ලක් වෙලා. මේ නිසා මේ දේවල් වලට පිළියමක් අප සොයමින් සිටියා. ඒ අතරෙදි අප සූකරයෙක් සමඟ කියලා නාට්‍යයක් කලා. මෙහිදී අපි දෙළොස් දෙනා එකතු වෙලා හිතුවා අපිට එකතු වුණොත් හොඳ නාට්‍යත් ඉතාම හොඳින් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වගේම ආර්ථික ප්‍රශ්න විසඳන්නටත් මේ කණ්ඩායම්ගත වීම විසඳුමක් වෙයි කියලා. ඒ අනුව අපි කණ්ඩායමක් ලෙස එකතු වුණා. අපට සම්පත් තියෙනවා. ඒ නිසා ඒ සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය අරගෙන වෙනත් අවශ්‍ය ශිල්පීන්ගෙනුත් උදව් අරගෙන වේදිකා නාට්‍ය කලාවේ තියැලෙන්න අපි කණ්ඩායම්ගත වුණා. එසේ පැවසුවේ සරත් කොතලාවල හා ධර්මප්‍රිය ඩයස්.

රංගන ශිල්පියෙක් මෙන්ම වේදිකා නාට්‍ය නිෂ්පාදකයක් ලෙස තමන්ගේ අදහස් දක්වන සරත් පවසන්නේ "මම පෞද්ගලිකව හිතනවා නාට්‍යයක් නිෂ්පාදනයේදී මගේ කාර්යය විශේෂයි. රංගන ශිල්පියෙක් ලෙසත් විශේෂයි. රංගන ශිල්පියෙක් විදියට විවිධ රංග ක්‍රම එනවා. අපි සාර්ථක වෙන්නේ ඒ නව ක්‍රම අනුගමනය කළොත් විතරයි. මේ දෙකටම ආර්ථික ප්‍රශ්න තමයි බලපාන්නේ. මේ නිසා කණ්ඩායම්ගත වීම තුළින් මේ ප්‍රශ්න වලට විසඳුමක් සොයා ගත හැකි වෙනවා, අනිවාර්යයෙන්ම". යනුවෙන්.

මේ පිළිබඳව කතා කරන ධර්මප්‍රිය පවසන්නේ "තමන්ගේ හැකියාවන් ඔප කර ගැනීමටත් තමන්ගේ කටයුතු පහසුවෙන් කර ගැනීමටත්, වෘත්තීය වශයෙන් දියුණුවක් ලැබීමටත් මේ තුළින් හැකියාව ලැබෙන බව"යි.

"විදේශීය රටවල වේදිකා නාට්‍ය කෙරෙන්නේ සමාගම් තුළින්. මේ නිසයි මේ නාට්‍ය සාර්ථක වෙන්නේ. මොකද මේ නාට්‍ය වෙනුවෙන් එතකොට මහන්සි වෙන්නේ කණ්ඩායමක්. එතකොට නාට්‍ය පිළිබඳව හැඟීම කණ්ඩායමකටම තියෙනවා. හැබැයි මේ දෙය සාර්ථක වෙන්නේ පොදු බව කියන මූලධර්මය උඩයි." ඔවුන් පවසනවා.

මේ සමාගමක් ලෙස එක්වීමෙන් අපි කරන්නෙ වසරකට වරක් නාට්‍යයක් කිරීම පමණක් නෙමෙයි. අපි වේදිකා නාට්‍ය කලාවට අවශ්‍ය සියුල්ම දේ මේ කණ්ඩායම් ගත වීම තුළින් ඉටුකර ගැනීමට උත්සාහ කරනවා. දැන් අපි කරන්න හදන්නේ බොහෝම හොඳ නාට්‍ය උළෙලක් කරන්න. ඒක මේ අපේ රටේ මෙතෙක් අප දුටු නාට්‍ය උළෙලක් නොවෙයි. බොහෝම පොහොසත් විදියට කරන්න හදන නාට්‍ය උළෙලක්. මේවා අපට තනියම කරන්න බැහැ. මේ සැම දේම සාමූහික කටයුතු විදියටයි කෙරෙන්න ඕනෑ. ඒ වගේම අප ලෝක නාට්‍ය කලාවෙන් අපේ රටට ගැළපෙන නිර්මාණ කරන්න ඕන. ඒ හැම දේම අපේ කරගෙන අපේ මුල් තියෙන තැන් සොයා ගෙන ඒ නිර්මාණ කෙරෙන්න ඕන. ඒ තුළින් ලබා ගන්නා අත්දැකීම් හා පරිණත බවෙන් ක්‍රමයෙන් ලෝක නාට්‍ය කලාවට අපේ ස්වතන්ත්‍ර නිර්මාණ ගෙන යාමේ උත්සාහයක තමයි අපි නියැලිලා ඉන්නේ. නැත්නම් මෙච්චර කාලයක් කවුරුත් දන්නේ නෑ අපේ රටේ හොඳ නාට්‍ය කලාවක් තියෙනවා කියලා. සරත් හා ධර්මප්‍රිය දෙදෙනාම පවසනවා.

අපට මේ ගමනේදී අපහසුතා ඇතිවෙන්නේ නෑ කියලා අපි කියන්නේ නැහැ. මොකද මේ රටේ කිසිම කෙනෙක් ප්‍රශ්න වලට විසඳුම් ලැබෙනවාට කැමති නැහැ. අපි රජයට කෑ ගැහුවා කෑ ගැහුවා. ඒත් කවුරුත් ප්‍රශ්න වලට විසඳුම් ලැබිය යුතු තැනින් බඩ වඩා ගත්තා මිසක් වේදිකා නාට්‍ය කලාවට සේවයක් කළේ නැහැ. අඩුම ගානේ ලෝකයේ පැවැත්වෙන හොඳ නාට්‍ය උළෙලකට අපේ නාට්‍යයක් අරින්න උත්සාහ කළේ නැහැ. මේවාට ඉසික් බැනලා වැඩක් නැහැ. මොකද ඒ අය වේදිකා නාට්‍ය කලාව ගැන හොඳන්න නිසා ඒ අයට ගාණක් නැහැ. ඒත් අපට එහෙම නැහැ. අපි හැදුණේ මේ වේදිකා නාට්‍ය කලාවෙන්. අපට යමක් ලැබුණේ මේ තුළින්. අඩු ගාණේ මේකවත් ආදර්ශයකට අරගෙන අනෙක් අයත් හැදුණොත් කොයිතරම් ලොකු දෙයක්ද? යනුවෙන් පැවසූ ඔවුන් කතා බහ අවසන් කළා.



ධර්මප්‍රිය ඩයස්

**ප්‍රියංවද දසනායක**

ඡායාරූප
මාලක වැලිගොඩපොල